**ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2022 දෙසැම්බර් 31 දිනට මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 07 (කාර්ය සාධනය වාර්තා කිරීම) ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අර්ධ වාර්ෂික ආදායම් වාර්තා නියමිත කාල සීමාව අවසන් වූ දින සිට දින 15 ක් තුළදී අදාළ චක්‍රලේඛයෙහි ආකෘති පත්‍ර අංක 02 භාවිතා කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2003.02.04 (මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාළ ගාස්තු) ආදායම් සංකේතාංකයට අදාළ ආදායම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රථම සහ දෙවන අර්ධ වර්ෂයේ ආදායම් පිළිවෙලින් රු. 155,689,759 ක් සහ රු. 163,878,332 ක් වී තිබුණි. | ආදායම් සම්බන්ධ බලතල බෙදා හැරීමකින් තොරව ප්‍රධාන කාර්යාලය විසින්ම අදාළ කාර්යයන් ඉටු කරන බැවින් චක්‍රලේඛ ප්‍රකාරව අර්ධ වාර්ෂික වාර්තා යැවීම සිදු කර නොමැත. පළාත් මට්ටමින් ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය මාසිකව ගෙන්වා ගෙන ආදායම් අයවීමේ ප්‍රවණතාවය අනුව ත්‍රෛමාසිකව අර්ධ වාර්ෂිකව ඒ පිළිබඳව අවධානය යොමු කර ආදායම් සීමාව සංශෝධනය කර ගැනීමටද අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව පෙන්වා දෙමි. ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය පරිදි වාර්තා යැවීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | අර්ධ වාර්ෂික ආදායම් වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මු.රෙ.128(2)(ඇ) ප්‍රකාරව තමා වගකීමට බැඳී සිටින විවිධ ආදායම් ශීර්ෂ, උප ශීර්ෂ විෂයයන් යටතේ එක් එක් මුදල් වර්ෂයේ ජූනි 30 වැනි දිනට හා දෙසැම්බර් 31 වැනි දිනට හිඟ රාජ්‍ය ආදායම් පිළිබඳ තත්ත්වය පෙන්නුම් කෙරෙන අර්ධ වාර්ෂික වාර්තා (හිඟ මුදල් නොමැතිනම් "හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය") පිළියෙල කොට පිළිවෙලින් ජූලි 31 සහ ඊළඟ මුදල් වර්ෂයේ ජනවාරි 31 වැනි දාට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර පිටපතක් රාජ්‍ය ආදායම් ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවට ද යොමුකළ යුතු වුවත් 2023 අප්‍රේල් 30 දින වන විටත් අදාළ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | ඒ අනුව අදාළ නිලධාරීන්ගේ අවධානය යොමු කර අදාළ වාර්තා විගණකාධිපතිටද පිටපත් සහිතව ඉදිරියේ දී යැවීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 22 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 වන වගන්තිය අනුව බැදීම් යනු භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අරමුණින් හෝ වැඩ කොන්ත්‍රාත් ඉටුකරවා ගැනීමේ අරමුණින් බාහිර පාර්ශවයන් සමඟ එළඹෙන ලද භාණ්ඩ, සේවා හා වැඩ සම්බන්ධ ගිවිසුම්/ ඇණවුම්වල වටිනාකම ලෙසත්, බැරකම් යනු විධිමත් පරිදි ලබා ගන්නා ලද භාණ්ඩ හා සේවා සහ සම්පූර්ණ කර ඇති බවට සහතික කර ඇති කොන්ත්‍රාත් සඳහා තවදුරටත් ගෙවිය යුතු වටිනාකම ලෙසත් නිර්වචනය කර ඇත. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයට අනුව මුළු එකතුව රු. 45,917,092 ක් වූ මෙහෙයුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇති සියලුම වටිනාකම් බැදීම් ලෙස හඳුනාගෙන තිබුණි. | වර්ෂ අවසාන මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේදී බැදීම්, බැරකම් හා බැරකම් ශේෂය ලෙස තීරු 03ක් මඟින් ඉදිරිපත් කළ යුතු වුවද, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල මඟින් ගෙන්වා ගන්නා ලද බැරකම් වාර්තාවල එය බැදීම් ශේෂය ලෙස පමණක් වාර්තා කර තිබූ නමුත් එම මුදලම බැරකම් හා බැරකම් ශේෂය ද වන බව පෙන්වා දෙමි. මින් ඉදිරියට මෙම වාර්තා ඉදිරිපත් කිරීමේ දී මෙම තොරතුරු වෙන් වෙන් ව එවීමට කටයුතු කරන බව සඳහන් කරමි. | ඉදිරි වර්ෂවලදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැරකම් බැදීම් ලෙස නොදැක්විය යුතුය. |

## 2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.9 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් සිදුවනු ලබන්නේ සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් (ප්‍රධාන කාර්යාලයෙන්), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 09 කින්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 25කින්, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 87 ක් හා මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය යන සමස්ත කාර්යාල පද්ධතිය මඟිනි. ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල විගණනය මඟින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් සඳහා පිළිතුරු ගෙන්වා ගැනීමේදී අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) මඟින් පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල මඟින්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මඟින් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල වෙත දැනුම් දී නැවත එම කාර්යාල අනුපිළිවෙල මඟින් නිර්දේශිත පිළිතුරු ගෙන්වාගෙන ඔබ වෙත ලබා දීම සිදු කළ යුතු බැවින් සති දෙකක් හෝ මාසයක් වැනි කාලයක් | විගණන විමසුම්වලට නියමිත කාලය තුළදී පිළිතුරු ලිවිය යුතුය. |

පිළිතුරු ලබා දීම ඉතා දුෂ්කර කාර්යයකි. විශේෂයෙන් 2022.12.31 දින අසන්නයේදී ලද විගණන විමසුම් සඳහා පිළිතුරු ගෙන්වා ගැනීමේදී මෙම කාර්යාලවල ප්‍රධානීන් ලෙස කටයුතු කළ නිලධාරින් බහුතරයක් ස්ථානමාරු ලැබීම හා විශ්‍රාම ගැනීම හේතුවෙන් අදාළ කටයුතු පිළිබඳව අධ්‍යයනය කර පිළිතුරු සැපයීම කළ යුතුව තිබූ හෙයින් පිළිතුරු සැපයීමේ යම් ප්‍රමාදයක් වුවත් 2023.05.31 දිනට පෙර ඉතිරි ව තිබූ විගණන විමසුමට ද පිළිතුරු ලබා දීමට කටයුතු කරමි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (අ) | දෙපාර්තමේන්තු නිත්‍ය නියෝගවල මායිම්ගල් පිළිබඳව වූ IV පරිච්ඡේදය | | | | |
| | (i) 4.13 හා 4.14 වගන්ති | නැත | මැනුම් සහයකයින් යොදා මායිම් ගල් සැකසීමේදී මායිම් ගල් 1000 කට වඩා තැනීමේ දී අදාළ පළාත් මැනුම්පතිගේ අනුමැතිය ලබා ගත යුතු වුවද පොළොන්නරුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය විසින් එසේ අවසර ගෙන නොතිබුණි. | පළාත් සර්වේයර් ජනරාල්වරයා වෙතින් මායිම්ගල් 1000 කට වැඩි ප්‍රමාණයක් සකස් කිරීමේ දී ලබා ගත යුතු අවසරය අතපසුවීමකින් ලිඛිතව ලබා ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේ දී විධිමත් ලිඛිත අවසරයක් ලබාගෙන මායිම් ගල් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත. | පළාත් මැනුම්පතිගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| | (ii) 4.15 වගන්තිය | නැත | මායිම් ගල් තැනීම මිනින්දෝරු අධිකාරිගේ අධීක්ෂණය යටතේ මැනුම් ඕවසියර් වෙත භාර දිය යුතු අතර, සිමෙන්ති, වැලි | මේ පිළිබඳව ඇති තොරතුරු හා ලේඛන පරීක්ෂා කිරීමේ දී දළ වශයෙන් මායිම් ගල් 42 - 46 ත් අතර ප්‍රමාණයක් එක් සිමෙන්ති | මායිම් ගල් පිළිබඳ නිවැරදිව ගණන් තැබිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | හා මි.මී.13 ප්‍රමාණයේ චිප් ගල් 1:2:3 යන අනුපාතයට යොදා කොන්ක්‍රීට් මිශ්‍රණය සකස් කරන්නේද යන්න පිළිබඳව නිතර පරීක්ෂා කළ යුතු වේ. මැනුම් ඕවර්සියර් විසින් එක් එක් දිනයේ තනන ලද මායිම් ගල් ගණන, ඉතිරිව තිබෙන ද්‍රව්‍ය සමඟ පරීක්ෂා කර බලා ඒ පිළිබඳව ගිණුම් තබා ගත යුතු වුවද, කඳුරුවෙල, ගිරිතලේ හා හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලවල ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කොට්ටයකින් සකස් කර ඇති බව හා සකස් කළ හැකි බව නිරීක්ෂණය කර ඇත. නමුත් තනන ලද මායිම්ගල් ලෙජර්ගත කිරීමේදී හා ඉතිරිව තිබෙන ද්‍රව්‍ය දෛනිකව පරීක්ෂා කර බලා ගිණුම් ගත කිරීමේදී සිදු කර ඇති අඩුපාඩුකම් පෙන්වා දී මින් ඉදිරියට එසේ නොවීමට වග බලා ගන්නා ලෙසට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | යුතුය. |
| (ආ) | අංක 01/2020 දරන 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් හඳුන්වාදෙන ලද මු.රෙ. 113 (6) (ආ) | වැඩ තහනම් කර ඇති නිලධාරින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 456,861 ක් සහ සේවය අතහැර ගොස් ඇති නිලධාරින් 102 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,546,630 ක්. | ලබාගත් ණය මුදල ගෙවා අවසන්විමට පෙර සේවය අතහැරයාම සහ වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය මැතිවරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශිය ලේකම් කාර්යාල හරහා පදිංචිය සහ ඔවුන්ගේ වත්කම් පිළිබඳ තහවුරුවක් ලබාගෙන නීතිපති මගින් ණය මුදල් අයකරගැනිමට කටයුතු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ වැඩ තහනම් කර ඇති නිලධාරින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 456,861 ක් අයකර ගැනිමට අපොහොසත් වී තිබූ අතර ඉන් රු. 330,963 ක් හෙවත් සියයට | 2021 වර්ෂය තුළදී පැවැති හිඟ ණය ශේෂයන්ගෙන් 184 න් 82 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම මත 2022 වර්ෂය වන විට හිඟ ණය ශේෂයන් ගණන 102 ක් වූ බව පෙන්වා දෙමි. 1/2020 මුදල් චක්‍රලේඛයේ නිර්දේශ අනුව කටයුතු කර 102 ක්ව පවතින ණය ශේෂ ප්‍රමාණය අඩු කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග තවදුරටත් සිදුකරමින් පවතින බව පෙන්වා දෙමි. | ණය අයකර ගැනීමට කටයුතු කර, අයකර ගැනීමට නොහැකි නම් ණය ශේෂ අත්හැරීම සඳහා ගත් ක්‍රියාමාර්ගවල සහතික කළ ලේඛන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්/ භාණ්ඩාගාරයේ ලේකම් වෙත යොමු |

| | | |
|---|---|---|
| | 72.44 ක් වර්ෂ 05 කට වැඩි කාල පරාසයකට අයත් ඒවා බව නිරීක්ෂණය විය. තවද සේවය අතහැර ගොස් ඇති නිලධාරින් 102 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 4,546,630 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර ඉන් රු.2,809,654හෙවත් සියයට 61.8 ක් වර්ෂ 05 වැඩි කාල පරාසයකට අයත් ඒවා විය. | කිරීම සඳහා වන ඉල්ලීමක් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "ඉඩම් තොරතුරු සැපයීමේ සදා ප්‍රමුඛයා" වන දැක්ම පෙරදැරි කර ගෙන "වෘත්තීය නිපුණත්වයෙන් යුත් සේවා ලැදි පිරිසක් මඟින් ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම" මෙහෙවර කර ගත්, දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර එනම් මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත හේතූන් මත සිදු කරන මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20 ක් වන අතර ඉඩම් කැබලි නම් 30 ක් ලෙස වර්ෂ 16 කටත් පෙර පිහිටුවාගත් සම්මතය **(Norms),** මැනුම් ශිල්පක්රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමඟ වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි. දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර පරිදි ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවන් සැපයීම යාවත්කාලීන වී නොතිබුණු නමුත්, 2018 සිට 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම් යටතේ නවීන මැනුම් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 430 ඉක්මවූ මුදලක් වැය කර තිබුණි. | මිනින්දෝරුවරයෙකු මාසයකදී සිදුකළ යුතු අවම වැඩ ප්‍රමාණයන් පිළිබඳව අවසන් වරට සංශෝධනය වී ඇත්තේ මීට වසර 16 කට පෙර, එනම් සර්වේයර් ජනරාල්ගේ ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ අංක 06/2007 මඟින් 2007 වසරේදීය. 2015 සර්වේයර් ජනරාල්ගේ ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ අංක 3/2015 හා 2021 චක්‍රලේඛ අංක 02/2021 මඟින් සිදු කළයුතු මාසික වැඩ ප්‍රමාණය සංශෝධනය කරන ලදී. එම අවස්ථා දෙකෙහිදීම රජයේ මිනින්දෝරු සංගමයේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයක් මඟින් ප්‍රගතිය ලබා දීමේ ඇති ගැටලු පෙන්වාදීම මත ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් එක් අවස්ථාවකදී එම චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම නැවැත්වීමටද අනෙක් අවස්ථාවේදී එය තාවකාලිකව අත්හිටුවීමටද කටයුතු කර ඇත. | නවීන මැනුම් ශිල්පක්‍රම හා උපකරණ තාක්ෂණික දියුණුව සමාලෝචනය කර ගුණාත්මක භූමි තොරතුරු නිපැයුම් හා සේවාවක් සැපයීම සඳහා, වර්ෂ 16 කටත් පෙර පිහිටුවාගත් මෙම සම්මතය වර්තමානයට ගැළපෙන පරිදි සමාලෝචනය කළ යුතුය. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 09 ක් යටතේ ලැබී ඇති මුළු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 98,818 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කළ සංඛ්‍යාව 76,142 ක් විය. ඒ අනුව එදිනට නිම නොකළ සංඛ්‍යාව 22,676 ක් හෙවත් සියයට 22.95 ක් විය. | මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති රජයේ මිනින්දෝරුවරුන්ට මාසිකව නිමකල යුතු වැඩ ඉලක්ක ප්‍රමාණයන් ලබාදී ඇති අතර ඔවුන් විසින් එම ඉලක්කයන්ට අදාළව වැඩ ප්‍රමාණයන් සෑම වර්ෂයකම අවසන් කරනු ලබයි. එක් එක් මැනුම් ඉල්ලීමට අදාළ වන වැඩ ප්‍රමාණයන් එකිනෙකට අසමාන අගයන් ගනී. සෑම වර්ෂයකදීම එම වසර තුළ නිම කිරීමට නොහැකි තරමේ වන විශාල මැනුම් ඉල්ලීම් ප්‍රමාණයක් ලැබීමත්, එම මැනුම් ඉල්ලීම් වලින් අපේක්ෂිත වැඩ ප්‍රමාණයන් ඉලක්කගත වැඩ ප්‍රමාණයට වඩා බොහෝ සෙයින් වැඩි අගයක් වීමත් යන හේතු මත සෑම වසරකදීම නිම කිරීමට නොහැකිව ඉතිරි වන මැනුම් ඉල්ලීම් ප්‍රමාණයක් වන බව පෙන්වා දෙමි. | නිම නොකළ මැනුම් නියෝග කාලීනව ඉටු කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 විදේශ ආධාර ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමෝධානික ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා (**Land Information Services System in Sri Lanka**) රාජ්‍යතාන්ත්‍රික එකඟතාවයක් ලැබී දේශීය අරමුදල් වලින් රු.20,000,000 ක්ද, විදේශීය අරමුදල්වලින් රු. 174,800,000 ක්ද වශයෙන් එකතුව රු. 194,800,000 ක් වෙන්කර තිබුණද ව්‍යාපෘතිය සඳහා, මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ක්‍රියාකාරි අනුමැතියක් ලැබී නොමැතිවීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. | අදාළ ණය ගිවිසුම් අත්සන් කර මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදනයන්

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් මැනුම් උපකරණ 30 ක් [GNSS RECEIVER (8C)] පිටකෝට්ට ප්‍රදේශයේ මැනුම් උපකරණ සපයන පුද්ගලික සමාගමකින් මිලදී ගැනීමට 2021 සැප්තැම්බර් 15 දින ගිවිසුම් ගත වී ඒ සඳහා ගෙවිය යුතු රු. 66,000,000 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණද අදාළ සැපයුම්කරුට එම උපකරණ තොගය සැපයීමට අපොහොසත් වීම මත ඇණවුම අවලංගු කිරීම නිසා මෙම තැන්පතු මුදල 2022 | | |

| | | |
|---|---|---|
| සැප්තැම්බර් 14 දින නැවත රජයේ ආදායමට බැර කර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) මැනුම් උපකරණ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 පරිදි ඇස්තමේන්තුවක් හා 4.2.2 වගන්තිය පරිදි කාලසටහනක් පිළියෙල කර, 2.5.1 (ඇ) වගන්තියට අනුව ප්‍රසම්පාදන කමිටු පළමු රැස්වීමේදීම ප්‍රසම්පාදනය පිළිබඳව ප්‍රචාරක දැන්වීම් පලකිරීම, ලංසු කැඳවීම් ලේඛන විකිණීම, ලංසු කැඳවීම අවසන් කිරීම හා විවෘත කිරීම සිදු කළ යුතු ආකාරය සහ දිනයන් නීර්ණය කිරීම ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකළ යුතු වුවත්, 2021 මාර්තු 10 දින රැස්වීමේදී ලංසු කැඳවන ආකාරය පමණක් අනුමත කර තිබුණද, දිනයන් තීරණය කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන කාල සටහනේ දින ඇතුළත ප්‍රසම්පාදන කටයුතු නිම කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි ප්‍රසම්පාදන කාර්යයන් සඳහා වෙන්වෙන්ව කාල වකවානු දැක්විය යුතුය. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 වගන්තිය අනුව ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයට අනුව වාර්තා කළයුතු වුවද, නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කිරිමේදී Yes /No ලෙස සටහන් කළ යුතු අවස්ථා පැහැදිලිව හඳුනාගත හැකි පරිදි සටහන් කර නොතිබුණි. එනම් එක උඩ එක ලියා තිබීම, Y /N වෙනුවට - /+ සලකුණු යොදා තිබීම හා කාබන් පෑනෙන් කුරුටු ගා තිබීම හේතුවෙන් ලංසු විවෘත කරන අවස්ථාවේදී නොසැලකිලිමත් ලෙස කටයුතු කර තිබුණි. | ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් කරන ලද සංශෝධනයක් එම ආකෘති පත්‍රයේ දැක්වේ. අතපසුවීම් හඳුනාගන්නා ලද හෙයින් මින් ඉදිරියට මෙවැනි තත්ත්වයන් ඇති නොවන ලෙස කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව **Y /N** ලෙස සටහන් කළ යුතුය. |
| (iii) 2021 සැප්තැම්බර් 10 දින ඇණවුම ලබාදුන් ලද වහාම එය නියමිත දිනට පෙර සැපයීමට සැපයුම්කරු කටයුතු කළ යුතු වුවද, සමාගම 2021 නොවැම්බර් 03 දින සිට 2021 දෙසැම්බර් 03 දින දක්වා අවස්ථා 5 කදී ණයවර ලිපි විවෘත කිරීමට ඇණවුම් ලබා දී තිබුණු අතර , මිලදී ගැනීම් ඇණවුම ලබාදුන් දින සිට ණයවර ලිපි විවෘත කිරීම, දින 53 සිට 82 දක්වා කාල පමාවකින් පසුව සිදුකර තිබුණි. ණයවර ලිපි 5 ම විවෘත කරන අවස්ථාවේදී ඇමරිකන් ඩොලරය රු. 203 ක් වී තිබුණු අතර, එය 2022 මාර්තු 07 වන දින දක්වාම එනම් ගිවිසුම අත්සන් කළ දින සිට මාස 6 කට ආසන්න කාලයක් නොවෙනස්ව පැවති බව නිරීක්ෂණය විය. එසේ තිබියදී ඉහත සැපයුම නිසි පරිදි සිදු නොකිරීම මත සැපයුම්කරුගේ රු. 6, 600, 000 ක කාර්යසාධන ඇපකරය මුදල් කරගත යුතුව තිබුණත් දෙපාර්තමේන්තුව විසින් එය සිදු කර නොතිබුණි. | රටේ කොරෝනා වසංගතය හා සංචරණ සීමා සහ රාජ්‍ය හා පුද්ගලික අංශයේ නිලධාරීන්ගේ පැමිණීම සීමා කිරීම හා ආර්ථික අර්බුදය හමුවේ ඇමරිකානු ඩොලර් මෙන්ම ණයවර ලිපි නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ දැඩි සීමාවන් හේතුවෙන් අවස්ථා කිහිපයකදී<br>දෙපාර්තමේන්තුව මඟින්ද සිදු කරන ලද සිහිගැන්වීම් අනුවද ණයවර ලිපි විවෘත කිරීම අවස්ථා කිහිපයකදී උත්සාහ කිරීම නිසා මෙම කාල පමාව සිදුවී ඇති බව පෙන්වා දෙමි. | සැපයුම්කරුගේ කාර්යසාධන ඇපකරය මුදල් කර නොගැනීම සම්බන්ධව පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) උඩුගම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ ඇති අංක WP LE – 3696 දරන කැබ් රථය සඳහා 2021 මාර්තු 19 දින මිල ගණන් කැඳවා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් ලබාගත් තීරණ අනුව, අවම මිල ඉදිරිපත් කළ | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී සර්වේයර් ජනරාල්ගේ මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම 2021 | අමාත්‍යාංශ ලේකම්ගේ ආවරණ අනුමැතිය |

| | | |
|---|---|---|
| ගාල්ල ප්‍රදේශයේ ගරාජයක් වෙත රු. 904,090 කට අලුත්වැඩියාව සඳහා යොමු කර තිබුණි. රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු අංක 38 දරන අතිරේකයෙන් සංශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) ප්‍රකාරව රු. 500,000 ඉක්මවා ඇති විටෙක ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන සිදු කළ යුතු අලුත්වැඩියාවක් වුවද එවැනි අනුමැතියක් ගෙන නොතිබුණි. | යන මැයෙන් අංක SG/BK/C/03/06 හා 2021.02.25 දිනැති ලිපියෙහි අංක 20 යටතේ වන කරුණු පිළිබඳව අවබෝධ කර නොගැනීම මත යම් යම් අඩුපාඩු සිදුවී ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරයේ අඩුපාඩුකම් හා අතපසුවීම් සිදු වී තිබේ ද යන්න පිළිබඳව නිශ්චිතව තීරණය කිරීම සඳහා මේවන විටත් මූලික විමර්ශණයක් සිදු කරමින් පවතින අතර ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතය. | ලබාගත යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැනුම් කටයුතු සඳහා 2021 දෙසැම්බර් 30 දින ඒකකයක් රු. 915,000 බැගින් පූර්ණමාන (Total Station) ඒකක 30 ක් රු. 27,450,000 ක් වැයකර දෙහිවල ප්‍රදේශයේ මැනුම් උපකරණ සපයන පුද්ගලික සමාගමකින් මිලදී ගෙන ඒකක 18 ක් 2022 මැයි හා ජුනි අතර කාලය තුළදීද, ඒකක 03 ක් 2022 නොවැම්බර් මාසය තුළදී බෙදාහැර ඉතිරි ඒකක 09 වර්ෂයකට අධික කාලයක් නිෂ්කාර්යව තබා ඉන් උපකරණ 08 ක් 2023 ජනවාරි හා මැයි 26 කාලය තුළදී බෙදා හැර පූර්ණමාන 01 ක් 2023 මැයි 26 දිනවන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවති බව විගණනයේදි නිරීක්ෂණය විය. | 2022 නොවැම්බර් මස පූර්ණමාන 03 ක්ද, 2023.01.17 දින පූර්ණමාන 05 ක් හා තවත් පූර්ණමාන 04 ක් ක්ෂේත්‍රයට අවශ්‍ය ඉල්ලීම් අනුව නිකුත් කිරීමට නියමිතව ඇත. 2023 වර්ෂය තුළ දී ඉතිරි උපකරණ ක්ෂේත්‍රයට නිකුත් කිරීමට නියමිතය. | උපකරණ මිලදී ගත් වහාම උපයෝජනය කළ යුතුයි. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ, ගිරිතලේ කාර්යාලය හා නිල නිවාසය ඉදිකිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු. 42,343,300 ක කොන්ත්‍රාත් වටිනාකමට පවරා එය 2017 වසරේ වැඩ ආරම්භ කර 2022 මැයි 05 දින එය සම්පූර්ණ කර අඩුපාඩු සහිතව දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. 2022 ජුනි 08 දින එම ගොඩනැගිල්ලේ තවදුරටත් පැවති අඩුපාඩු පිළිබඳව එම කාර්යාලයේ මිනින්දෝරු අධිකාරි විසින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ උපකරණ හා ගොඩනැගිලි අංශයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි වෙත දන්වා තිබුණද 2022 සැප්තැම්බර් 16 දින දක්වාද එම අඩුපාඩු සකස් කර නොතිබුණි. එහෙත් නිල නිවස ඉදිකිරීම සම්බන්ධ අත්සන් කර තිබුණු අවබෝධතා ගිවිසුමට අනුව | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඉදි කිරීම් කාර්යයන් උසස් ප්‍රමිතියෙන් යුතුව මනා උපදේශකත්වය සහිතව සිදු කරන නිසා ඉදිකිරීම් කාර්යය සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු පිළිබඳව උපදෙස් ලබා දීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොමැත. හඳුනාගන්නා ලද අඩුපාඩුකම් නිවැරදි කර ගැනීමට සෑම උත්සහායක්ම දරා ඇත. මේ අනුව අප දෙපාර්තමේන්තුව විසින් නිසි අධීක්ෂණය, පසු විපරම, සෝදිසි කිරීම හා නිසි ආකාරයෙන් | සියලු අඩුපාඩු නිවැරදි කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුවට පෙර, සහ පසු නඩත්තු කාලය තුළ සිදු කළ යුතු කටයුතු සඳහන් කර තිබුණත් ඒවාට අනුගතවී කටයුතු කර තිබුණු බවක් හා එම කටයුතු නිසියාකාරයෙන් සිදුවූවාද යන්න පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණයක්, පසු විපරමක්, සෝදිසි කිරීමක් හා නිසියාකාරයෙන් යාවත්කාලීන විසඳුම් ලබා ගැනීමක් සිදු කර නොතිබුණි. | යාවත්කාලීන විසඳුම් ලබා ගැනීමට නිරතුරුවම කටයුතු කර ඇති බව යවා ඇති ලිපි මඟින් සනාථ වන බව සඳහන් කරමි. එමෙන්ම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් වෙත 2022.11.22 දින ලිපියක් යොමුකරමින් රැඳවුම් මුදල් නිදහස් කර ඇත්ද යන්න සහ අඩුපාඩු සම්පූර්ණ කර නොදීම සම්බන්ධ සියලු පැහැදිලි කිරීම් දැන්වීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. එමෙන්ම දෙපාර්ශවය විසින් හඳුනාගත් අඩුපාඩු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කර ඇත්දැයි ගිරිතලේ ප්‍රාදේශිය කාර්යාලයේ මිනින්දෝරු අධිකාරි මඟින් නිරතුරුවම විමසීම් කරන බවද පෙන්වා දෙමි. | |
| (ඇ) | රු. 12,030,000 ක් වැයකර ඉදිකරන ලද කුච්චවෙලි සංචාරක නිවාස 2016 ජුනි 26 දින විවෘත කර තිබුණි. එම සංචාරක නිවාසයේ සිට වෙරළට යැමට තිබෙන මාර්ගයේ දෙපස විදුලි පහන් සවි කිරීම සඳහා 2022 වර්ෂයේ රු. 106,296 ක මුදලක් වැය කර තිබුණු අතර සංචාරක නිවාසයේ මෙම අවශ්‍යතාවයට වඩා ප්‍රමුඛතාවය දිය යුතුව තිබූ පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | | |
| (i) | A හා B ගොඩනැගිලි දෙකෙහිම විද්‍යුත් පරිපථ නිසි පරිදි ක්‍රියාත්මක නොවූ අතර කාමරවල වායු සමන යන්ත්‍ර පැවතියද ඒවා ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. | මෙම අඩුපාඩු සැකසීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට සැලසුම් කර ඇති බව සඳහන් කරමි. | නොපමාව අඩුපාඩු සම්පූර්ණ කර ගත යුතුය. |
| (ii) | නාන කාමරවල වතුර මල් හා කරාම තුළින් ප්‍රමාණවත් ජල සැපයුමක් නොතිබුණි. | ලවණ සහිත සියුම් වැලි සහිත ජලය බෙදා හැරෙන බැවින් කරාම හා වතුර මල් යනාදියෙහි ලවණ හා වැලි තට්ටු බැඳීම නිරන්තරයෙන් සිදු වන බැවින් මෙවැනි තත්වයක් මින් ඉදිරියට ඇති නොවන ලෙස සංචාරක බංගලාව පිරිසිදුවට හා පිළිවෙලට පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කරන ලෙස බංගලා භාරකරු වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. | අඩුපාඩු නොපමාව සකස් කළ යුතුය. |

## 3.6 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී සිදු වූ වාහන අනතුරු 08 ක අලාභවල එකතුව රු. 480,675 ක්ද, 1998 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සිදු වී ඇති වාහන අනතුරු 17 කට අදාළව එකතුව රු. 3,992,991 ක්ද, හා 1989 සිට 2022 වර්ෂය දක්වා මැනුම් උපකරණ හා වෙනත් හානිවීම් සම්බන්ධ සිද්ධීන් 13 කට අදාළව එකතුව රු. 2,285,369 ක්ද වශයෙන් එකතුව රු. 6,759,035ක කපා නොහළ හා අයකරගත යුතු ඉදිරියට ගෙන යන ශේෂ පැවතියද එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම එම ශේෂය තුළ වසර 03 ත් 09 අතර පරාසයක වූ රු. 2,161,107 ක්ද, වසර 10 ත් 30 ත් අතර පරාසයක වූ රු. 1,322,930ක් විය. | මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන් අංක 01 ලෙස අදාළ තොරතුරු පිටු අංක 40 සිට 43 දක්වා හෙළිදරව් කිරීම සිදු කර ඇත. | අවසන් ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණු බැවින් එම අලාභයන් අවසන් ගිණුම්වල හෙළිදරව් කළ යුතුය. |
| (ආ) | මායිම් ගල් ආඥා පනතේ 4.19 වගන්තිය ප්‍රකාරව හරි වැරදි බැලීමේ පහසුව සඳහා එක් එක් මධ්‍යම මායිම් ගල් ගබඩාවක තිබෙන මායිම් ගල්, සියයේ (100) ඒකක වශයෙන් ගොඩ ගැසිය යුතු අතර එසේම මායිම් ගල් ආඥා පනතේ 4.43, 4.44 සහ 4.45 වගන්ති ප්‍රකාරව ඒවා කැඩී යාම සම්බන්ධයෙන් සිදු වන අලාභ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. නමුත් ත්‍රිකුණාමලය ප්‍රාදේශිය මිනින්දෝරු කාර්යාලයේ මායිම් ගල් පිළිබඳව භෞතික පරීක්ෂා කිරීමේ දී ඒවා නිසි පරිදි ගබඩා කර නොතිබුණු අතර ඒ හේතුවෙන් සැලකිය යුතු මායිම් ගල් ප්‍රමාණයක් කැඩී යාම සම්බන්ධ විධිමත් අධීක්ෂණ ක්‍රියාවලියක් සිදුව ඇති බවක්ද නිරීක්ෂණය නොවීය. | නිත්‍ය නියෝග අනුව මායිම්ගල් ගබඩා කර තැබිය යුතු බව අදාළ උපදෙස් නැවතත් ලබා දී ඇති අතර කැඩී ඇති මායිම්ගල් සම්බන්ධයෙන් නිත්‍ය නියෝග 4.43 යටතේ කටයුතු කිරීමට ද උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත. | කැඩී ඇති මායිම්ගල් වෙනුවෙන් අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.7 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගුවන් මැනුම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් මස 31 දින රු. 8,868,900 ක් ගෙවා දේශීය නියෝජිත ආයතනයකින් මිනිසුන් රහිත ගුවන් යානයක් (Unmanned Aerial Vehicle) මිළදී ගෙන තිබුණු අතර 2017 අගෝස්තු 03 දින හබරණ ප්‍රදේශයේදී එය යාන්ත්‍රික දෝෂයකට ලක්ව තිබුණි. එය අලුත්වැඩියා කිරීමෙන් පසු නැවත වරක් 2019 අප්‍රේල් 18 දින එහි විදුලි කෝෂය අක්‍රියවීමත්, 2019 ජූලි 17 දින | අලුත්වැඩියාවෙන් පසු 2019 අප්‍රේල් මස 18 දින ගුවන්ගත කිරීමට සූදානම් වූ විට මෙම උපකරණය සමඟ ලබා දී තිබූ වියළි කෝෂ ඉදිමී තිබූ බැවින් නියෝජිත ආයතනය මඟින් වියළි කෝෂ 02 ක් මිල දී ගැනීමට සැලසුම් කර ඇත. 2019 අප්‍රේල් 21 දින සිදු වූ පාස්කු බෝම්බ සිද්ධිය හේතුවෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සියලුම ඩ්‍රෝන යානා ගුවන් ගත කිරීම තහනම් කරන ලදි. එම නිසා ආරක්ෂක නිශ්කාෂණ ලබා ගැනීම | ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නඩත්තු කළ හැකි උපකරණ මිලදී ගැනීමත්, මෙවැනි සේවාවන් කුලී පදනමින් ලබා ගැනීමේ හැකියාව පිළිබඳවත් අවධානය යොමු කළ යුතුය. |

වන විට හයිපර් එස්. ආර්. (Hipper SR) ටොප් කොන් (Top con) වර්ගයේ ජී.එස්.පී.(GSP) උපකරණය ක්‍රියා විරහිත වීමත්, 2021 මාර්තු 04 දින වන විට යානය සඳහා ලබාදී තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර තිරයේ දෝෂයක් පවතින බවද වාර්තා කර තිබුණි. ඉන් පසු 2022 අප්‍රේල් 26 දින යානයේ අවර පෙත්ත සවි කර තිබුණු රබර් පටිය කැඩී යාම හෝ ගැලවී යාම නිසා හානි සිදු වී තිබුණි. මෙම යානය මිලදී ගෙන වර්ෂ 07 ක් ඉක්මවා තිබීම හා වසර දෙක හමාරක පමණ කාලයක් මෙය ගුවන් ගත කර නොමැති වීම නිසා යානය ගර්හිත කිරීමට සුදුසු බවට 2023 මැයි 08 දිනැති ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු (විශේෂ මැනුම් හා තත්ත්ව පාලන) විසින් දන්වා තිබුණි. මෙම යානය 2016 වර්ෂයේ සිට 2022 දක්වා අවස්ථා 05 කදීම ක්‍රියාවිරහිතව තිබුණු බැවින් එයින් ඵලදායි සේවාවක් අත්කර ගෙන නොතිබුණු අතර ඒ අනුව මෙය ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

හා වියළි කෝෂ මිලදී ගැනීමද යන කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී. Hipper SR (Topcon) වර්ගයේ උපකරණ කොටසේ දෝෂය මෙම යානය මඟින් ඡායාරූප ගෙන ඉදිරි කටයුතු කිරීමට බාධාවක් නොවුනු අතර සිදු කරනු ලබන ක්‍රියාවලියේ වෙනසක් පමණක් සිදු වේ.

eBee (Drone) කට්ටලය සමඟ ලබා දී තිබෙන ලැප්ටොප් පරිගණක තිරයේ දෝෂයක් පැවති අතර එම දෝෂය නිවැරදි කර දෙන ලෙස ඉල්ලා තිබුණද එම දෝෂයද UAV යානය ගුවන්ගත කිරීමට බාධාවක් නොවන බව පෙන්වා දෙමි.

බැටරි මිලදී ගැනීමෙන් පසු ඩ්‍රෝන යානයේ අවර පෙත්ත සවිවී තිබූ රබර් පටිය කැඩීයාම හෝ ගැලවී යාම නිසා යානය බිමට පතිත වීම හේතුවෙන් එහි අවර පෙත්තට සිදු වූ හානිය අලුත්වැඩියා කර ගැනීම සඳහා ගුවන් හමුදා ඩ්‍රෝනර් බලඇණය වෙතින් තාක්ෂණික සහය ලබා ගැනීමට කටයුතු කර ඇත.

ගුවන් හමුදා ඩ්‍රෝනර් බලගනයේ නිලධාරීන් වාචිකව මෙම යානයේ දෝෂය නිවැරදි කළද එය ගුවන්ගත කිරීමේදී සමතුලිතතාවේ ගැටලු මතුවී නැවත බිමට පතිතවීමේ හැකියාව ඉහළ බැවින් මෙම අලුත්වැඩියාව ප්‍රයෝජනවත් නොවනු ඇති පවසා ඇත. තවද මෙම යානාවේ සියයට 90ක පමණ කොටස් සැහැල්ලු ප්ලාස්ටික් වැනි ද්‍රව්‍යකින් නිපදවා ඇති බැවින් ද මේ වන විට මෙම යානාව මිලදීගෙන වසර 07ක ඉක්මවා ඇති බැවින්, නියෝජිත ආයතනය සතුව පවතින මෙම වර්ගයේ යානාවන් දැනට භාවිතයෙන් ඉවත් කර ඇති බවටත්, ඩ්‍රෝන යානාවේ මෙම වර්ගය දැනට අදාළ මව් ආයතනයේද නිෂ්පාදනය නොකරන බවටත් වාර්තා වී ඇත. මේ තත්ත්වයන් යටතේ අදාළ ඩ්‍රෝන යානාවේ උපාංග අලුත්වැඩියාවකදී, මිලදී ගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදු වන බැවින් මේ සඳහා නියෝජිත ආයතනය සමඟ ගිවිසුම්ගත වීම ප්‍රතිඵලදායක නොවන බැවින් සුදුසු නිලධාරී මණ්ඩලයක් පත් කර මෙම

| | | | |
|---|---|---|---|
| | | ඩ්‍රෝන යානය ගර්භිත කිරීමට කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දී ඇත. 2016 වසරේ සිට 2017 අගෝස්තු මස 03 දින මෙය අනතුරකට පත්වන තෙක්, අදාළ කාල සීමාව තුළදී ජාතික වශයෙන් ද වැදගත් වන ව්‍යාපෘති කිහිපයක්ද සමඟින් තවත් අමතර කාර්යභාරයන් නිමකර ඇති බව දැක්විය හැක. | |
| (ආ) | ත්‍රිකුණාමලය ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ භාවිතයක් නොමැතිව පවතින පෙරසවි කඳවුරු 07 ක් වෙනුවෙන් එක් කඳවුරක් සඳහා මාසිකව රු. 50 බැගින් වර්ෂයක් සඳහා රු. 4,200 ක් විදුලි බල මණ්ඩලයට ගෙවනු ලබන අතර අංක 162 දරන පෙරසවි කඳවුරේ 2019 වර්ෂයේ සිටි නිලධාරියා විසින් එහි ජල බිල්පත ගෙවා නොතිබීම හේතුවෙන් ජල සැපයුම විසන්ධි කර තිබීම නිසා, ඒවා නැවත යාවත්කාලීන කිරීම වෙනුවෙන් 2020 නොවැම්බර් 27 දින දෙපාර්තමේන්තු ප්‍රතිපාදනවලින් ඒ සඳහා රු. 10,362 ක් ගෙවා තිබුණු අතර මෙය ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය. | දැනට මෙම කඳවුරු සම්පූර්ණයෙන් උපයෝජනය නොවන බැවින් අබලන් තත්වයට පත්ව තිබුණ ද හදිසි අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීමේ අපේක්ෂාවෙන් තවදුරටත් පවත්වාගෙන යනු ලබයි. ලංකාව පුරා මෙවැනි පෙර සවි කඳවුරු විශාල ප්‍රමාණයක් ඇති බැවින් හා විවිධ ප්‍රදේශවලට විවිධ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන බැවින් අවශ්‍යතාවය අනුව ගලවා ඉවත් කර සුදුසු ස්ථානවලට ලබා දීම සිදු කරනු ලබයි. එතෙක් විදුලිය විසන්ධි කර නැවත විදුලිය ලබා ගැනීම විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් මාසයකට රුපියල් 50 ක ස්ථාවර ගාස්තුවක් පමණක් ගෙවා විදුලි සම්බන්ධතාවය පවත්වාගෙන යනු ලබයි. කෙසේ වෙතත් ඉදිරියේ දී මෙම අවශ්‍යතාවයන් සමාලෝචනය කර අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා ලබා දීමට කටයුතු යොදා ඇත. | අවශ්‍යතාවයන් නැවත සමාලෝචනය කළ යුතුය. |

## 3.8 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම සඳහා 2023 ජුනි 12 පිළිතුරු එවා නොතිබුණි.

| විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 29 දිනැති අංක PAL/B/SGD/2022/AQ/13 දරන විගණන විමසුම - ගාල්ල මිනින්දෝරු කාර්යාලවල වත්කම් උපයෝජනය | මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් සිදුවනු ලබන්නේ සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් (ප්‍රධාන කාර්යාලයෙන්), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල 09 කින්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල 25කින්, ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල 87 ක් හා මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය යන සමස්ත කාර්යාල පද්ධතිය මගිනි. ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල විගණනය මඟින් ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම් | විගණන විමසුම්වලට නියමිත කාලය තුළදී පිළිතුරු ලිවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා පිළිතුරු ගෙන්වා ගැනීමේදී අතිරේක සර්වේයර් ජනරාල් (ක්ෂේත්‍ර) මගින් පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල මඟින්, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මඟින් ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල වෙත දැනුම් දී නැවත එම කාර්යාල අනුපිළිවෙළ මගින් නිර්දේශිත පිළිතුරු ගෙන්වාගෙන ඔබ වෙත ලබා දීම සිදු කළ යුතු බැවින් සති දෙකක් හෝ මාසයක් වැනි කාලයක් පිළිතුරු ලබා දීම ඉතා දුෂ්කර කාර්යයකි. විශේෂයෙන් 2022.12.31 දින ආසන්නයේදී ලද විගණන විමසුම් සඳහා පිළිතුරු ගෙන්වා ගැනීමේදී මෙම කාර්යාලවල ප්‍රධානීන් ලෙස කටයුතු කළ නිලධාරීන් බහුතරයක් ස්ථානමාරු ලැබීම හා විශ්‍රාම ගැනීම හේතුවෙන් අදාළ කටයුතු පිළිබඳව අධ්‍යයනය කර පිළිතුරු සැපයීම කළ යුතුව තිබූ හෙයින් පිළිතුරු සැපයීමේ යම් ප්‍රමාදයක් වූවත් 2023.05.31 දිනට පෙර ඉතිරි ව තිබූ විගණන විමසුමට ද පිළිතුරු ලබා දීමට කටයුතු කරමි. | |

## 3.9 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු මුදල් ලේඛනය, ඉන්ධන අත්තිකාරම් ලේඛනය සහ මායිම්ගල් ලේඛනය යන ලේඛන සඳහා පොදුවේ භාවිතා කළ හැකි ආකෘතීන් පැවතුණද, ගිරිතලේ, ත්‍රිකුණාමලය, කන්තලේ, පොළොන්නරුව සහ කඳුරුවෙල යන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල ඔවුන්ට ආවේණික වූ ආකෘතීන් සකස් කර භාවිතා කර තිබුණි. | සුළු මුදල්, ඉන්ධන අත්තිකාරම් සහ වෙනත් අත්තිකාරම් සඳහා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග පරිච්ඡේද i හි පරිදි ද, පරිච්ඡේද අංක iv හි පරිදි මායිම්ගල් සැකසීම ගබඩා කිරීම, නිකුත් කිරීම, පියවීම යනාදී සියලු කාර්යයන් නිවැරදිව පවත්වාගෙන යන ලෙසටත් පළාතට අයත් සියලුම ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල දැනුවත් කරන ලෙස පළාත් සර්වේයර් ජනරාල්වරුන් මඟින් සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන් වෙත දැනුම් දී ඇත. ඒ අනුව කටයුතු කරන බවට කාර්යාල පරීක්ෂාවන්වලදී ද නිරතුරුව පසු විපරම් කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. | පොදු ආකෘතීන් භාවිතයට යොදා ගැනීමට උපදෙස් ලබා දිය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පොළොන්නරුව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීගේ නිල නිවසේ විදුලි බිල්පත අයි.ඩබ්ලිව්.ඒ.එස් වික්‍රමාරච්චි, අංක 07, මහවැලි නිවාස සංකීර්ණය, නව නගරය, පොළොන්නරුව යන පුද්ගලයකුගේ නමටද, ජල බිල්පත ආර්.එම්.එස්.බී. රත්නායක, අංක 07, මහවැලි නිවාස සංකීර්ණය, නව නගරය, පොළොන්නරුව යන පුද්ගලයකුගේ නමටද ලැබී තිබෙන අතර, තාක්ෂණික හා පරිපාලන නිලධාරීගේ නිල නිවසේ විදුලි බිල්පත අයි.ආර්.පී.එස්. ධර්මදාස යන පුද්ගලයකුගේ නමටද, ජල බිල්පත මිනින්දෝරු අධිකාරී, අංක 13, පොලිස් නිල නිවාස, පොළොන්නරුව යන ලිපිනයටත් ලැබී නිරවුල් කර තිබුණි. දෙපාර්තමේන්තුව නමින් බිල්පත් සංශෝධනය කර ගැනීමට කටයුතු කරගෙන නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නිල නිවසේ ජල බිල්පතේ හා විදුලි බිල්පතේ හි නම සංශෝධනය කරවා ගැනීමට උපදෙස් ලබා දී ඇත. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇති මෙම නිල නිවාසවල ලිපිනයන් අදාළ තනතුරු නාමයෙන් සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

| සේවා වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,144 | 951 | 193 | 0 |
| තෘතීයික මට්ටම | 83 | 27 | 56 | 0 |
| ද්විතීයික මට්ටම | 1,172 | 995 | 177 | 0 |
| ප්‍රාථමික මට්ටම | 4,890 | 3,553 | 1,337 | 0 |
| තාවකාලික(බහුකාර්ය) | 0 | 170 | - | 170 |
| එකතුව | 7,289 | 5,696 | 1,763 | 170 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනුමත කාර්යය මණ්ඩලයට සාපේක්ෂව ජ්‍යෙෂ්ඨ මට්ටමේ සියයට 16 ක්, තෘතීයික මට්ටමේ සියයට 67 ක්, ද්විතීයික මට්ටමේ සියයට 15 ක් හා ප්‍රාථමික මට්ටමේ සියයට 27ක් වශයෙන් සමස්ත කාර්යය මණ්ඩල පුරප්පාඩු සියයට 24 ක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. | නිරීක්ෂණ හා එකඟ වේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හෝ අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුවේ නැගෙනහිර පළාත් මිනින්දෝරු කාර්යාලයේ ගණකාධිකාරි හා තාක්ෂණ නිලධාරී යන තනතුරු දෙකම පුරප්පාඩු වී තිබුණි. | ගණකාධිකාරි සේවයේ තනතුරු පුරප්පාඩු සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් නිලධාරින් අනුයුක්ත කරන අතර එම අමාත්‍යාංශයේ අවධානයට යොමුකර ඇත. එම පුරප්පාඩුව පුරවන තෙක් ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි නැගෙනහිර පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ පුරප්පාඩු වී පවතින සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ වැඩ බැලීම සඳහා ගණකාධිකාරී III/II ශ්‍රේණියේ නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කරමින් පවතී. තවද පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල සඳහා තාක්ෂණ නිලධාරී තනතුරේ සේවය අවශ්‍ය නොවන බව පෙන්වා දෙමි. | පුරප්පාඩුව පවත්නා අත්‍යවශ්‍ය තනතුරුවලට නිලධාරින් බඳවා ගැනීම සහ අනවශ්‍ය තනතුරු අහෝසි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ත්‍රිකුණාමල දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ තාක්ෂණ සහ පරිපාලන නිලධාරී යන තනතුරුවලට අදාළ රාජකාරී කටයුතු සියල්ලම සිතියම් තාක්ෂණ නිලධාරී විසින් ඉටු කර තිබුණි. | "කාර්මික හා පරිපාලන නිලධාරි" යනු එක් තනතුරකි. කාර්මික හා පරිපාලන නිලධාරි තනතුර යනු සිතියම් තාක්ෂණ නිලධාරි සේවයේ විශේෂ සේවයේ නිලධාරීන් අතුරින් තෝරා පත්කර ගනු ලබන තනතුරකි. කාර්මික හා පරිපාලන නිලධාරි තනතුරේ පුරප්පාඩු 12 ක් සම්පූර්ණ කිරීම සඳහා දැනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමුකර ඇත. එම අනුමැතිය ලැබෙන තෙක් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුමය වැඩපිළිවෙලක් යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ කාර්මික හා පරිපාලන නිලධාරී පුරප්පාඩුවේ රාජකාරී ආවරණයට සිතියම් තාක්ෂණ නිලධාරිවරයෙකු පත් කිරීමට කටයුතු කර ඇත. | පුරප්පාඩු වී ඇති තනතුරුවලට නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |